# ආසියාවේ විශිෂ්ට නිළියෝ



නළුවකු, නිළියක රංගන ජීවිතයේ අභිෂේක ලබන්නේ රංගනය අගයමින් සම්මානයක් තම දෝතට හිමිවන විටයි. එය ඔස්කාර් සම්මානයක් නම් ජීවිත කාලයටම එය අභිමානයක්, කිරුළක් වනවා නිසැකයි. එක් වරක් හෝ ඔස්කාර් සම්මානයකට හිමිකම් කීමට ලැබීම ඕනෑම නළුවකුගේ හෝ නිළියකටත් සිහිනයකි. එහෙත් ආසියාතික රංගන ශිල්පීන්ට ශිල්පිනියන්ට නම් එය තවමත් සිහිනයකි.මේ නිසා CNN පුවත් සේවය මගින් සදාකාලික විශිෂ්ට රංගනයන් දායාද කළ ආසියානු නළු නිළියන් විසිපස් දෙනෙකු නම් කර තිබේ.

එම විශිෂ්ට රංගධරයන් අතර අපේ පුංචි රටේද නිළියක සිටීම අපට ආඩම්බරයකි. ඇය **"මාලනී ෆොන්සේකායි"** .
මාලනී ෆොන්සේකා හෙළ සිනමාවේ නිළි රැජින, එම සාඩම්බරය අපට ලබාදුන් ආකර්ෂණීය සිනමා තාරකාවියයි. රුක්මණී දේවියගෙන් ඇරඹි අපේ නිළි පරපුරේ වර්තමාන නිළි රැජින මාලනීය. 1968 "පුංචි බබා" සිනමා පටයෙන් හෙළ සිනමාවට එක් වූ ඇය මුල් වරට මෙරටට අන්තර්ජාතික මට්ටමේ සම්මානයක් ගෙන දුන්නේ 1975 දීය. මොස්කව් අන්තර්ජාතික සිනමා උළෙලේදී ඇය සම්මානයට පාත්‍ර වූවාය.

1977 දී නවදිල්ලි සිනමා උළෙලේදීත් ඇය ඇගැයීමට ලක්විය. මෑතකදී මාලනී ලක්බිමට කීර්තියක් ගෙන ආවේ 2009 වසරේදී "ආකාස කුසුම්" හි රංගනයටයි. ඇය එහි සන්ධ්‍යා රාණි ලෙස කළ රංගනයට 39 වන අන්තර්ජාතික ඉන්දීය සිනමා උළෙලේ හොඳම සම්මානය දිනා ගත්තාය. මාලනී ආසියාවේ විශිෂ්ට නිළියක ලෙස CNN පුවත් සේවයෙන් නම් කළේ 1972 නිධානය සිනමා පටයේ රංගනය උදෙසාය.
මාලනී මෙන්ම දක්ෂම පැ නිළියන් දසදෙනාගේ තොරතුරු සංක්ෂිප්තව මෙහි දැක්වේ.




**චීනයේ ෂෞ ක්ෂන්** (ZHOY XUN )

වර්තමාන සිනමාවේ ජනප්‍රිය ලාබාල නිළියකි. The Equation of Love and Death , Perhaps Love' සිනමා පට සඳහා සම්මාන රැසක් හිමි කරගත් ඇය Suzhou River සිනමා පටයේ කළ රංගනයට ආසියාවේ විශිෂ්ට නිළියක ලෙස නම් කෙරුණි.




**චීනයේ ගොන්ග් ලී** – ( Gong Li )

ගොන්ග් ලී, චීන සිනමාවේ සිටින දක්ෂ නිළියකි. ඇයගේ දක්ෂම අන්තර් ජාතික මට්ටමෙන් මීට පෙරද අගය කර තිබුණි. 1987 Red Shorghum, Raise the Red Lantern, The Story of Qiu Ju චිත්‍රපටවල ඇය රංගනයෙන් පැ දක්ෂම හේතුවෙන් ඒෂියාවීක් සඟරාව මගින් ඇය ලොව හොඳම නිළියක ලෙස සඳහන් කර ඇත.
1992 ප්‍රීමියර් සඟරාව ඇයගේ රංගන කුසලතාවය කෙතරම් අගය කළාද කිවහොත් ගොන්ග් ලී ලෝකයේ සෑම කාලයේම අති විශිෂ්ට රංග ශිල්පිනියක බව දක්වා තිබුණි.



**මීනා කුමාරි** - MEENA KUMARI
"භාරතයේ කඳුළු බිංදුව" මීනා කුමාරි කෙසේ නම් මතකයෙන් බැහැර කරන්නද?
1931 වර්ෂයේ සිට මීනා චිත්‍රපට 90 ට වැඩි ගණනක රඟපා තිබේ. බයිජු බව්රා, පරිනීතා , පාකීසා, වැනි සිනමා පට රැසකම අති විශිෂ්ට චරිත නිරූපනයක යෙදුණු මීනා, විශිෂ්ට නිළියක ලෙස ඇගැයුමට ලක්වුණේ "සාහිබ් බීබි ඖර් ගුලාම්" (1962 තිරගත විය) චිත්‍රපටයේ රංගන භූමිකාවටයි. ඒ ආදර සබඳතා බිඳ වැටීමෙන් , මත් පැනට ඇබ්බැහිවන තමන්ව තේරුම් ගන්නා ලෙස සමාජයෙන් ආයාචනය කරන චරිතයක් ඇය නිරූපනය කළාය.
මෙම චරිතය ඇයගේ සැබෑ චරිතයට බොහෝවින්ම සමීප චරිතයක් විය.
මීනා වර්ෂ 1972 දී අකාලයේ මිය ගියේ අධික ලෙස මත්පැන් පානය කර සිරෝසිස් රෝගයට ගොදුරු වීමෙනි.



**භාරතයේ නාගිස්** (NARGIS)
ශ්‍රී ලාංකික අප, අපේ සිනමා පට මෙන්ම භාරත සිනමාපටත් රස විඳින්නේ ඒවා අපේම කරගෙනය. එනිසා භාරත තරු කැළ අපට කිසි දිනක අමුත්තන් නොවෙයි. ආසියාවේ විශිෂ්ටයන් ලෙස තේරුණු භාරත නළු නිළියන් පස් දෙනාම අපේ රසික රසිකාවියන්ගේ විරුවරයන්ය. විරවරියන්ය. මෙම පස්දෙනා අතර ලාංකික රසික හද බැඳගත් භාරත සිනමා තාරකාවියන් දෙදෙනෙකුද සිටී. නාර්ගිස් ඉන් එක් නිළියකි.
හතලිහ, හැට දශකවලදී භාරත සිනමාව තරු ගුණයෙන් හා දක්ෂ කමින් ඒකාලෝක කළ, අදටත් අති විශිෂ්ට නිළියක ලෙස අගය කරන නාර්ගිස් වඩාත් ප්‍රකට හැඟීම් ස්වභාවිකව ප්‍රකාශ කිරීමට විශිෂ්ට හැකියාවක් පෙන්වූ නිළියක ලෙසයි. ඇය ආසියාවේ විශිෂ්ට නිළියක වූයේ 1957 වසරේදී , දිරිය කතක් ලෙස "මදර් ඉන්ඩියා" හි කළ රංගනයටයි. රාජ් කපූර් තම චිත්‍රපට රැසකටම ප්‍රධාන නිළි භූමිකාවට තෝරා ගත්තේ නාර්ගිස්ය.